සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

**11 ශ්‍රේණිය** වර්ෂ අවසාන පරීක්ෂණය - 2018 **14 S I**

**කතෝලික ධර්මය I** **කාලය පැය තුනයියි**

**උපදෙස් :**
- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **අංක 1 සිට 40 තෙක් ප්‍රශ්න වල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(01) දේව වේදීය ඉතිහාසයක් පිළිබඳ කථා කරන පුරාණ ගිවිසුමේ, ඉතිහාස පොත් පමණක් ඇතුළත් වනුයේ,
1. ජෝෂුවා, I මකබ්, ජෝබ් 2. විරාවලිය, තෝබිත්, එස්රා
3. එස්තර්, ප්‍රේම ගී, ජුඩිත් 4. එස්රා, හිතෝපදේශය, ගණන් කථාව

(02) ලූක් ශුභාරංචියේ දෙවන කාණ්ඩය ලෙස සලකනු ලබන්නේ ශුද්ධ බයිබලයේ කුමන ග්‍රන්ථයද?
1. මතෙව් ශුභාරංචිය 2. එළිදරව්ව
3. අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත 4. රෝම ලිපිය

(03) අපෝස්තලික යුගයේදී ශුද්ධ වූ සභාවට මහඟු සේවයක් කළ විශිෂ්ඨ පුද්ගලයකු වනුයේ,
1. ශුද්ධ වූ පාවුලුතුමා 2. ශුද්ධ වූ ස්තේපන් තුමා
3. ශුද්ධ වූ පේදුරුතුමා 4. ශුද්ධ වූ මාක්තුමා

(04) යහපත් හා අයහපත් බලවේග අතර ගැටුමක් පෙන්නුම් කරන්නේ,
1. ද්විත්වවාදය 2. යුගාන්තවාදය
3. සංකේත භාවිතය 4. ආරූඪ නාමයකින් ඉදිරිපත් කිරීම

(05) "මෙතැන් පටන් මනුෂ්‍ය පුත්‍රයාණෝ දෙවියන් වහන්සෙගේ බලපරාක්‍රමයේ දකුණු පස වැඩ හිඳිනු ඇත" යන පිළිතුරෙන් කුපිත වූ බව්හු ජේසුස් වහන්සේව රැගෙන යන්නේ කවුරුන් වෙතටද?
1. හෙරෝද් වෙත 2. ජුදා ශ්‍රේෂ්ඨාධිකරණයට
3. උත්තම පූජකයා වෙත 4. ආණ්ඩුකාර පිලාත් වෙත

(06) ජේසුස් වහන්සේව කුරුසියේ ඇණ ගසනු ලබන ස්ථානය වනුයේ,
1. ගෙත්සෙමෙන 2. කපාල පිටිය 3. මල් උයන 4. සීනයි කන්ද

(07)
- යහපත් දිවි පෙවෙතක් ගත කිරීම
- ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වීම
- ප්‍රඥාවෙන් පූර්ණ වීම

යන ලක්ෂණ දැකිය හැකි පුද්ගල කාණ්ඩය වනුයේ,
1. උපස්ථායකයින්ය 2. ප්‍රේරිතයින්ය 3. ශ්‍රාවකයින්ය 4. වැඩිහිටියන්ය

(08) රෝමයේ නිරෝ අධිරාජ්‍යයේ පීඩන සමයේ ශුද්ධ වූ පාවුලු තුමා මරණයට පත් වූයේ,
1. ගෙල සිර කිරීමෙනි 2. වස පානය කිරීමට දීමෙනි.
3. හිස ගසා දැමීමෙනි 4. වද හිංසා පැමිණ වීමෙනි.

(09) පහත කරුණු සැලකිල්ලට ගන්න.
A - ජෝර්ජ් මාරියෝ බර්ගෝලියෝ
B - 1960 පූජකවරය ලැබීම.
C - 2001 කාදිනල් තනතුරට පත් වීම.
D - 2013 ශුද්ධෝත්තම පියතුමා ලෙස පත්වීම.
E - 265 ශුද්ධෝත්තම පියතුමාය.
අති උතුම් ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමාට අදාල කරුණු පමණක් ඇතුළත් වරණය වනුයේ,
1. B, C, E ය. 2. A, C, D ය 3. A, B, C ය 4. C, D, E ය

(10) ශුද්ධාත්මික ක්‍රිස්තු දේහයේ අවයවයන් පිළිබඳ ව කතා කරන ශුද්ධ වූ පාවුළු තුමාගේ ලිපිය වනුයේ,
1. හෙබ්‍රෙව් ලිපිය 2. රෝම ලිපිය 3. ගලාති ලිපිය 4. I කොරෙන්ති ලිපිය

(11) 1961 පාසැල් රජයට පවරා ගැනීම තුළ සිදු වූ යහපත් ප්‍රතිඵලයක් වනුයේ,
1. ආගම සතියට කාලච්ඡේද දෙකකට සීමා වීම. 2. පාසැල් පරිපාලනය රජය සතු වීම.
3. කතෝලික පරිසරය කතෝලික පාසැල් තුළින් ගිලිහීම.
4. දීප ව්‍යාප්ත දහම් පාසල් ක්‍රමය බිහිවීම.

(12) නව ගිවිසුමේ රොටි කැඩීම යනුවෙන් අදහස් කරනු ලැබුවේ කුමක්ද?
1. දිව්‍ය පූජාව සිදු කිරීම 2. ආහාර වැළඳීම
3. පාළුකරයේ ගමන 4. මිසරයේ දුක්විඳීම

(13) පුරාණ ගිවිසුමේ වන්දනාවේ කේන්ද්‍රිය ක්‍රියාව වනුයේ
1. දෙවියන්ට ස්තුති කිරීම. 2. යාග පූජා පුද කිරීම.
3. දිව්‍ය පූජාව පැවැත් වීම. 4. දෙවිඳුන්ට කන්නලව් කිරීම.

(14) තමාව මරණයට පත් කිරීමට පැමිණි තුර්කි ජාතික අලි අග්කා නැමැති දක්ෂ වෙඩික්කරුවාට සමාව ලබා දෙනු ලැබුවේ,
1. ශුද්ධ වූ තෙරේසා මව්තුමිය 2. ගරු මයිකල් රොද්‍රිගෝ පියතුමා
3. ශුද්ධ වූ දෙවන ජුවාම් පාවුළු මුනිතුමා 4. ශුද්ධ වූ ජුසේවාස් පියතුමා

(15) _______ මෙන් සැම අභියෝගයකදීම දෙවියන් වහන්සේට ප්‍රශංසා කිරීමට අපට හැකි නම් දේව ප්‍රේමය අසීමිතව අත් දැකීමට අපට හැකිය. හිස් තැනට වඩාත් සුදුසු පිලතුර වනුයේ,
1. ආදි මව්පියන් 2. ආබ්‍රහම්තුමා 3. යෙසායා දිවැසිවරයා 4. මරි මවුන්

(16) "දෙමව්පියන්ට ගෞරව දැක්වීම දෙවියන් වහන්සේ වෙත ඇති ගරු බිය මත පිහිටා ඇති අතර එය ශුද්ධාත්ම දීමනාවකි" මෙලෙස සඳහන් වනුයේ,
1. කතෝලික සභා ධර්මෝපදේශය 2. මහෝපදේශය
3. නව ගිවිසුම 4. උත්පත්ති පොත

(17) සැම කිතුණුවෙකුම මර්යාදාව තුළ ආදර්ශමත් ජීවිතයක් ගත කිරීමට පොරොන්දු දී ඇත්තේ කුමන දේව ප්‍රසාද නිධානය තුළින්ද?
1. දිව්‍ය සත්ප්‍රසාදය 2. ප්‍රසාද ස්නාපනය.
3. අභිවෘද්ධි ආලේපනය 4. සමඟි වීමේ දේව ප්‍රසාද නිධානය

(18) සැබෑ කිතුණුවන් ලෙස සත්‍යය තුළ ජීවත් වීමේදී අප කළ යුත්තේ කුමක්ද?
1. පාපොච්චාරණය කිරීමය. 2. හෘදය සාක්ෂියට කතා කිරීමට නිතරම ඉඩදීම
3. සත්‍ය දැක නොදුටුවා සේ සිටීමය. 4. අන් අයට සත්‍යවාදී වන ලෙස ප්‍රකාශ කිරීමය

(19) ජනවන්දනා වසරේ ප්‍රධානතම හා ප්‍රථම මංගලෝත්සවය වනුයේ කුමක්ද?
1. නත්තල් මංගල්‍යය 2. දේවස්ථාන මංගල්‍යය
3. පාස්කු මංගල්‍යය 4. ස්වර්ගාරෝපණ මංගල්‍යය

(20) දිව්‍ය පූජාවේ ප්‍රධානතම යාච්ඤාව වනුයේ,
1. ස්තෝත්‍ර යාගික යැදුම 2. පඬුරු මත යැදුම
3. පොදු යැදුම 4. බොදුනෙන් පසු යැදුම

(21) හෙබ්‍රෙව් භාෂාවෙන් "ටෝරා" යන වචනයේ, අර්ථය කුමක්ද?
1. ඉගැන්වීමයි. 2. මඟ පෙන්වීමයි 3. බෙදා ගැනීමයි. 4. සහභාගිකමයි

(22) කතෝලික බයිබලයෙහි පුරාණ ගිවිසුමෙහි ද්විතීය සම්මත ග්‍රන්ථ ගණන වනුයේ,
1. 10 කි. 2. 12 කි. 3. 07 කි. 4. 09 කි.

(23) ප්‍රධාන හා සුළු දිවැසිවරුන් ලෙස වර්ගීකරණයයේ පදනම වන්නේ කුමක්ද?
1. දිවැසිවරුන්ගේ සේවාවය 2. එක් එක් දිවැසිවර ග්‍රන්ථයේ විශාලත්වයයි.
3. දිවැසිවර සේවාවේ යෙදුණ කාලයයි. 4. දිවැසිවරයාගේ විශ්වාසයයි.

(24) ඉතා ගැඹුරු දේවධාර්මික සංකල්ප ගෙන හැර දක්වමින් තම සුපුවත ඉදිරිපත් කරන ශුභාරංචි කතුවරයා වන්නේ කවුරුන්ද?
1. ශු. මතෙව් තුමාය. 2. ශු. ජොහාන් තුමාය 3. ශු. ලූක් තුමාය 4. ශු. මාක් තුමාය

(25) මැවීමේ පළමු කථාව, ජනවන්දනාත්මක රාමුවක් තුළ දේව ධාර්මික අර්ථයකින් මැවිල්ල දින හතකට සීමා කර ඇත්තේ කුමන සම්ප්‍රදාය තුළද?
1. යාවේ සම්ප්‍රදාය 2. ද්විතීය නිතී සම්ප්‍රදාය 3. පූජක සම්ප්‍රදාය 4. එලෝහිම් සම්ප්‍රදාය

(26) කායින් සහෝදර ප්‍රේමයට පිටු පා යමින් තම සහෝදරයාව මරා දැමීමට හේතු වූ මුල් අගුණ පාපය වන්නේ මින් කුමක්ද?
1. ක්‍රෝධය 2. අලසකම 3. තණ්හාව 4. ඊර්ෂ්‍යාව

(27) සාමාන්‍ය එඬේරික ජීවිතයක් ගත කළ හැකි ඉශ්‍රායෙල් ජනතාව සුවිශේෂි දේව ජනතාවක් බවට පත් වන්නේ කුමක් මගින්ද?
1. සීනයි ගිවිසුම මගිනි 2. ව්‍යවස්ථාව මගිනි. 3. ජුදා නීතිය මගිනි. 4. දිවැසිවරු මගිනි.

(28) මනස්ථාපයේ කාල ලෙස, ශුද්ධ වූ සභා මාතාව ජනවන්දනා වසරේ නම් කර ඇති. ප්‍රධාන කාලදෙක වන්නේ මින් කුමක්ද?
A - ආගමන කාලය B - නත්තල් කාලය C - චතාරික කාලය D - පාස්කු කාලය
1. A, B ය. 2. B, C ය 3. A, C ය 4. A, D ය

(29) "ජීවත් වීම යනු ක්‍රිස්තුන් වහන්සේ සමඟ විසිමයි" යනුවෙන් ප්‍රකාශ කරන ලද සභා පිතෘවරයා වන්නේ,
1. ශුද්ධ වූ අගුස්තිනු තුමා 2. ශුද්ධ වූ අම්බ්‍රෝස් තුමා
3. ශුද්ධ වූ ජස්ටින් තුමා 4. ශුද්ධ වූ සිරිල් තුමා

(30) ප්‍රසාද ස්නාපනයේ ප්‍රධාන හා අනිවාර්‍ය සංකේතනය වන්නේ කුමක්ද?
1. සුදු වස්ත්‍රය 2. පාස්තු ඉටි පහන 3. ශුද්ධ වූ තෛලය 4. ජලය

(31) මුල් කිතුනු සභාව තුළ රෝගීන්ගේ ආලේපය නැමැති දේව ප්‍රසාද නිධානය පැවති බව සඳහන් වන ලිපිය වන්නේ,
1. රෝම ලිපිය 2. I ජොහාන් ලිපිය 3. ජාකොබ් ලිපිය 4. පිලමොන් ලිපිය

(32) "ධර්මදානය පූජක හා පැවදි අයගේ පමණක් නොව ගිහියාගේ ද දිවැසිවර කාර්යකි" මෙලෙස සඳහන් වනුයේ,
1. කතෝලික සභ ධර්මෝපදේශයහීය 2. ශුද්ධ බයිබලය
3. සභා නීතිය තුළය 4. මහෝපදේශය තුළය

(33) "මිනිසාගේ රැකවරණයට ලක් වූ දේව මැවිල්ල මනුෂ්‍ය වාසයට යෝග්‍යය වන්නේ එය සංරක්ෂණය කරමින් පරිභෝජනය කළ හොත් පමණි" එය හඳුන්වන්නේ,
1. ආර්ථික සංවර්ධනය 2. ධරණීය සංවර්ධනය
3. පරිභෝජන සංවර්ධනය 4. සමාජීය සංවර්ධනය

(34) "ත්‍රී එක සුර ජේසුනේ" ගීතිකාව රචනා කරන ලද්දේ කවුරුන් විසින්ද?
1. ශු. ජුසේවාස් පියතුමා විසිනි. 2. ශු. තෙරේසා මව්තුමිය විසිනි.
3. ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමා විසිනි. 4. මොසැසි පෙරේරා පියතුමා විසිනි.

(35) යාච්ඤාවේ මූලිකාංගයක් වන්නේ මින් කුමක්ද?
1. නිවැරදි ඉරියව්වෙන් දෙවියන් වහන්සේව ඇමතීම 2. හුදෙකලා ස්ථානයක දෙවියන් ඇමතීම.
3. හඬ නගා යාච්ඤාවේ යෙදීම. 4. ඉරු දින දිව්‍ය පූජාවට සහභාගි වීම.

(36) "මරියා තුමිය සිය මවගේ කුසයෙහි පිළිසිඳ ගත් පළමු මොහොතේ සිටම විශේෂ දේව වරමින්, ජන්ම පාප කිළුටෙන් නිදොස් වූවාය" යනුවෙන් ප්‍රකාශයට පත් කරන ලද ශුද්ධෝත්තම පියතුමා වනුයේ,
1. අති උතුම් දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමාය.
2. අති උතුම් හයවන පාවුළු ශුද්ධෝත්තම පියතුමාය.
3. අති උතුම් නවවන පියුස් ශුද්ධෝත්තම පියතුමාය.
4. අති උතුම් දහතුන්වන ලියෝ ශුද්ධෝත්තම පියතුමාය.

(37) දේව මාතාවන් "බර්ණදෙත්" නැමැති දැරියට දර්ශනය වූයේ කිනම් නුවරදීද?
1. පාතිමා නුවර 2. ලූර්දු නුවර 3. වේලක්කනන්නි නුවර 4. ලන්චියානෝ නුවර

(38) සැඳෑ යාම යැදුමෙදිහාවිතා කරන ලද ප්‍රශංසා ගීතය කුමක්ද?
1. සෙකරියස් තුමාගේ ප්‍රශංසා ගීතය 2. මරියතුමියගේ උදාන ගීතය
3. සිමියොන් තුමාගේ ප්‍රශංසා ගීතය 4. මෝසෙස් තුමාගේ ජය ගීතය

(39) යාම යැදුම් සම්ප්‍රදාය ජේරුසලමේ තිබූ බව තම දින පොතෙහි ලියන ලද ස්පාඤ්ඤ ජාතික පැවදි කාන්තාව වනුයේ කවුරුන්ද?
1. එජේරියා 2. හෙලේනා 3. මාර්තා 4. ලූසියා

(40) දේවාශිර්වාදය ලබා ගැනීමට නම් ස්රව සම්පූර්ණයෙන්ම නිදොස් විය යුතු බවත් පූර්ණත්වයේද ඉහළ තලයකට නොපැමිණි අයට ධ්‍යානයට සම වැදිය නොහැකි බවත් උගන්වන ලද වේද භේදය වනුයේ,
1. ක්වායටිසම් වේදභේදය 2. ජන් සෙනිසම් වේදභේදය
3. ඒරියන් වේදභේදය 4. ඒව්ටිකියන් වේද භේදය

සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved



11 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2018 | 14 S I

# කතෝලික ධර්මය II

උපදෙස් :
- පළමු වන ප්‍රශ්නය හා තෝරා ගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු වන ප්‍රශ්නයට ලකුණු 20 ක්ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.

(01) i. ජීවන සහා සම්ප්‍රදාය පිළිබඳ කරුණු සඳහන් කරන නව ගිවිසුමේ ග්‍රන්ථ දෙක නම් කරන්න.
ii. ලන්දේසි පාලන අවධියේ ලංකාවට පැමිණි ඔරතෝරියානු පූජකවරුන් දෙදෙනා නම් කරන්න
iii. දවන යාග පූජා සඳහා භාවිතා කළ පක්ෂීන් දෙවර්ගය ලියන්න.
iv. මිනසා අන් මැවිලිවලට වඩා වෙනස් වීමට හේතු වන කරුණු 2ක් ලියන්න.
v. ජේසුස් වහන්සේ අන්තිම රාත්‍රී භෝජනයෙන් පසු යාච්ඤා කිරීමට ගිය උයන හඳුන්වන නම් 2ක් ලියන්න.
vi. දෙවියන් වහන්සේ අති උත්කෘෂ්ඨ තැනැත් වහන්සේ ලෙස හඳුන් වන සම්ප්‍රදායන් 2ක ලියන්න.
vii. මිසරයේ රජතුමා ඊශ්‍රායෙල් ජනතාවගේ ශ්‍රමයෙන් ඉදිකළ ගබඩා නගර 2ක නම් කරන්න.
viii. පදවි පූජක පොරොන්දු 2ක ලියන්න.
ix. ශුද්ධ වූ සභාව තුළ වයස අවු 18 - 60ත් අතර අයට එක්වර ශිලය රැකීමට නියම වන දිනයන් 2ක ලියන්න.
x. සදාචාරාත්මත භාවනාවේ පියවරයන් 2ක ලියන්න.

(02) i. ශුද්ධ වූ පාවුළු තුමාගේ හසුන් පත්වලට අමතරව වෙනත් හසුන් ලියන ලද ජේසුස් වහන්සේගේ අපෝස්තුලුවරුන් දෙදෙනකු නම් කරන්න.
ii. ශුද්ධ වූ පාවුළුතුමා සිරගතව සිටියදී ලියන ලද හසුන් තුනක් නම් කරන්න.
iii. ශුද්ධ වූ පාවුළු තුමාගේ ජීවිතයෙන් ඔබගේ විශ්වාසයේ ජීවිතයට ගත හැකි ආදර්ශ 5ක් විස්තර කරන්න.

(03) i. ශුද්ධ වූ සතියේ ප්‍රධාන ජනවන්දනා දිනයන් දෙකක් ලියන්න.
ii. ජනවන්දනාවේ ප්‍රධාන අංග තුන ලියන්න..
iii. චතාරික සමය තුළ ඔබ ජීවිත වෙනසක් ඇති කර ගන්නා ආකාරයන් 5ක් විස්තර කරන්න.

(04) i. ජේසුස් වහන්සේගේ දේව පුත්‍ර භාවය ලොවට අනාවරණය වන අවස්ථා 2ක් ලියන්න.
ii. ජේසුස් වහන්සේ මුහුණ දුන් පරීක්ෂා 03 ලියන්න.
iii. ජේසුස් වහන්සේගේ පරික්ෂා තුළ කිතුණු ඔබ ඇදහිල්ලට සාක්ෂි දරණ ආකාරය කරුණු 5 කින් පැහැදිලි කරන්න.

(05) i. පූජා ප්‍රසාදිවරුන් බෙදෙන ප්‍රධාන කොටස් 2ක ලියන්න.
ii. සේවයේ ප්‍රසාද නිධාන අනෙකුත් ප්‍රසාද නිධාන වලින් වෙනස් වීමට හේතු වන කරුණු 03ක් ලියන්න.
iii. පූජාප්‍රසාදි වහන්සේලා වෙනුවෙන් ගිහියන්ගේ යුතුකම් 5ක් පැහැදිලි කරන්න.

(06) i. දේව මාතාවන් වෙනුවෙන් පවත් වනු ලබන භක්ති අභ්‍යාස 2ක් ලියන්න.
ii. ශුද්ධ වූ සභා මාතාව මරියතුමිය වෙනුවෙන් පවත්වනු ලබන මංගල්‍යයන් 03 ක් ලියන්න.
iii. මරියතුමියගේ ජීවිතයෙන් තරුණ ඔබේ පිවිතයට ගත හැකි ආදර්ශයන් 5ක් විස්තර කරන්න.

(07) පහත සඳහන් මාතෘකාවලින් දෙකක් තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.
i. ඉරුදින ශුද්ධවත්ව ගත කරමු.
ii. යාච්ඤාවෙන් සවිමත් වෙමු.
iii. ජේසුස් වහන්සෙගේ සිදු කළ ප්‍රතිහාර්යය.
iv. සාමය පිළිබඳ කිතුනු ඉගැන්වීම්.

## වර්ෂ අවසාන පරීක්ෂණය - 2018
## **කතෝලික ධර්මය - 11 ශ්‍රේණිය**
### පිළිතුරු පත්‍රය

කොටස I

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (01) | 2 | (11) | 4 | (21) | 1 | (31) | 3 |
| (02) | 3 | (12) | 1 | (22) | 3 | (32) | 1 |
| (03) | 1 | (13) | 2 | (23) | 2 | (33) | 2 |
| (04) | 1 | (14) | 3 | (24) | 2 | (34) | 3 |
| (05) | 4 | (15) | 4 | (25) | 3 | (35) | 1 |
| (06) | 2 | (16) | 1 | (26) | 4 | (36) | 3 |
| (07) | 1 | (17) | 2 | (27) | 1 | (37) | 2 |
| (08) | 3 | (18) | 2 | (28) | 3 | (38) | 2 |
| (09) | 2 | (19) | 3 | (29) | 2 | (39) | 1 |
| (10) | 4 | (20) | 1 | (30) | 4 | (40) | 2 |

II පත්‍රය

(01)
- I ජොහාන්, I පේදුරු
- II ජුසේවාස් පියතුමා, ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමා
- III කොබෙයියන්, පරවියන්
- IV දේව ස්වරූපය හා සමානකම ඇතිව මිනිසා මවා ඇත.
  ජීවන හුස්ම ලබා දී ඇත.
- V මල් උයන, ගෙත් සෙමනේ උයන
- VI ඒලෝහිම්, පූජක
- VII පීතොම්, රමසෙස්
- VIII කීකරුකම , පූජක බඹසර
- IX අළු බදාදා, මහ සිකුරාදා
- X සවන් දීම, මෙනෙහි කිරීම

(02)
- I පේදුරු, ජොහාන්, ජුද්, ජකොබ්
- II කොලොස්සි, පිලිප්පි, පිලෙමොන්
- III
  - ධර්මදූත චාරිකාවලදී නොයෙකුත් බාධා, අභියෝග හා දුක්කම්කටොළුවලට මුහුණ දීම සිරගත කරනු ලැබීම.
  - ගල් ගසා නගරයෙන් පිටතට ඇද දැමීම
  - ජුදයන්ගේ විරෝධයට ලක් වීම.
  - කිසිම අවස්ථාවක ක්‍රිස්තුන් වහන්සේ වෙනුවෙන් සාක්ෂි දැරීමට පසුබට වුයේ නැත.
  - කිතුණු ඇදහිල්ල හා යුතුකම් පෙන්වා දීම

  මෙවැනි කරුණු දරුවාගේ ජීවිතයට සම්බන්ධ කර ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(03)
- I ගොබ් ඉරුදින/ මහා බ්‍රහස්පතින්දා/ මහා සිකුරාදා/ ආලේලුයියා සෙනසුරාදා
- II දිව්‍ය පුජාව, දේව ප්‍රසාද නිධාන, යාම යැදුම
- III
  - යාච්ඤාවේ හා මර්ධනාවේ ජිවිතයකට සම වැදෙන කාලයකි.
  - පසුතැවිල්ලේ, ආත්ම පරිත්‍යාගයේ හා ජීවිත වෙනසක් ඇති කර ගැනීමේ කාලයයි.
  - අපගේ ප්‍රසාද ස්තාපනීය ජිවිතය නවතාවයකට පත් කරන කාලයකි. එනම් පාපයට මැරී නව ජිවිතයකට උපත ලැබීමේ කාලයකි.
  - ලෞකික අශාවන්ට, ආර්ථමාර්ථයට මැරි, දෙවිදුන් තුළ නිදහස් දරුවන් මෙන් ජීවත් වීමේ කාලයකි.
  - මර්ධන ක්‍රියා කිරීම.
  - දාන ධර්ම දීම.
  - අසරණයන්ට පිහිට වීම.
  - සමාව දීම.
  - ශුද්ධ වු පැය හා පාද නමස්කාරය වැනි භක්ති අභ්‍යාසවල නිරත වීම වැනි කරුණු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(04) I බෞතිස්ම ස්නාපනය / පාළුකරයේ පරීක්ෂාවලට මුහුණ දීම (අන්‍ය රූප විලාශ වීම)

II 1.පරීක්ෂාව - ඔබ දෙවියන් වහන්සේගේ පුත්‍රයා නම් මේ ගල් ගෙඩිය පාන් ගෙඩියක් වන්නට අණ කළ මැනව.

2.පරීක්ෂාව - ඔබ මා ඉදිරියෙහි නමස්කාර කරන්නෙහි නම් ඒ සියල්ල ඔබ සන්තක වන්නේය.

3.පරීක්ෂාව - දේව මාලිගාවේ කොත මුදුනේ සිටුවා " ඔබ දෙවියන් වහන්සෙගේ පුත්‍රයා නම් මෙතනින් පහතට පනින්න. ඔබට රැකවරණය සලසනු වස් දෙවියන් වහන්සේ සිය දූතයන්ට අණ දෙනු ඇත.

III
- දෙවිඳුන් තුළ ස්ථිර විශ්වාසයෙන් කටයුතු කිරීම.
- තමන් සතු බලය සහ හැකියා ආත්මාර්ථකාමීව නොව සමාජ යහපත සඳහා යෙදවිය යුතුය.
- ආහාරයෙන් ජීවත් වන ශාරීරික ජීවිතයට වඩා දේව වචනයෙන් පෝෂණය වන අධ්‍යාත්මික ජීවිතය වැදගත්ය.
- අප ජීවිතය තුළ දෙවිඳුන්ට හිමි තැන ධනයටත්, බලයටවත් ලබා නොදිය යුතුය.

යනාදි කරුණු ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(05) I පදවි පූජාප්‍රසාදිවරු/ පැවදි පූජා ප්‍රසාදිවරු

II
- ධර්මදූත මෙහෙවරක් පැවරෙයි.
- දේව ජනතාව ගොඩ නඟයි.
- අන් අය ගැලවීම් තුළින් තම ගැලවීම සලසා ගනියි.

III
- ඔවුන් වෙනුවෙන් යාච්ඤා කිරීම හා ඔවුන්ට ගෞරව කිරීම.
- මීසම් සේවාවන්ට සහාය දීම.
- දේව රාජ්‍යය පතල කිරීමේ කටයුතුවලට සහාය වීම.
- ධර්මෝපදේශ සේවාවන්ට සම්බන්ධ වීම.
- ජනවන්දන කටයුතු වලට සහාය වීම
- පොදු වැඩ කටයුතු වලදී සහයෝගය දීම.
- ඔවුන්ව නඩත්තු කිරීම හා ආරක්ෂා කිරීම.

(06) I සදාසරණ නුවානය/ ජපමාලය

II
- ජන. 01 - පාරිශුද්ධ දේවමාතාවන්ගේ මංගල්‍යය
- පෙබ 04 -කානික්ක මංගල්‍ය
- මැයි 31 - එළිසබෙත් තුමිය බැහැ දැකීමේ මංගල්‍යය
- සැප් 08 - මරිය තුමිය උපන් මංගල්‍යය
- අගෝ. 15 -මරියාතුමියගේ ස්වර්ගාරෝපණය වීමේ මංගල්‍යය
- දෙසැ. 08 - දේවමෑණියන්ගේ නිර්මල පිළිසිඳීමේ මංගල්‍යය

III
- දේව වචනයට අවනතව, විශ්වාසයේ ජිවිතයක් ගත කිරීම.
- පරිත්‍යාගශීලි ජිවිතයක් ගත කිරීම උදා: එළිසබෙත්තුමියට ඇබ උපස්ථාන කිරීම.
- බැහැපත් බව තුළ දිවි ගෙවීම. උදා : දේව පුත්‍රයාගේ මව වීම තුළ
- සියලු දේ සිත්හි නිදන් කර ගනිමින් යාච්ඤාවේ ජිවිතයක් ගත කිරීමත
- ජන්ම පාපයෙන් නිදොස්ව ජීවත් විම.
- අසරණයන්ට පිහිට වීම.. උදා : කානා නුවර මගුල් ගෙදර

ආදි කරුණු ජිවිතයට සම්බන්ධ කර ගනිමින් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(07) I **ඉරු දින ශුද්ධවත්ව ගත කරමු.**
- සම්පූර්ණ දිව්‍ය පූජාවට හරියාකාරව සුදානමකින් යුතුව භක්තියෙන් සහභාගී වීම.
- වෙනත් දිනවලට වඩා යාච්ඤාවෙන් ගත කිරිමට
- රෝගීන් බැලීමට යාම.
- දෙමාපියන්ට හා අන් අයට උදව් වීම.
- ශුද්ධ ලියවිල්ල කියවීම, ඒ පිළිබඳ ව මෙනෙහි කිරීම.
- විවිධ සමිති සමාගම්වලට සහභාගී වීම.
- විවිධ සමිති සමාගම්වලට සහභාගිවලට සහභාගි වීම.
- විවේකයෙන් ගත කිරීම ආදි කරුණු ඇත්නම් ලකුණු ලබා දෙන්න.

II **යාච්ඤාවෙන් සවිමත් වෙමු.**
- යාච්ඤාව කිතුණු ජීවිතයේ අනිවාර්ය අංගයක් බව
- යාච්ඤාව තුළ කිතුණු ජීවිතය රදා පැවතීම.
- යාච්ඤාව , දෙවියන් වහන්සේ සමඟ කරන සුහද සංවාදයක් බව
- යාච්ඤාවේ පරිසරයක් නිවසේ ගොඩ නගා ගත යුතු බව.
- යාච්ඤා කරන අවස්ථා
- යාච්ඤා කරන ආකාරයන්
- පවුලක් ලෙස යාච්ඤා කිරිමේ වැදගත්කම
- යාච්ඤාවෙන් අධ්‍යාත්මික ජිවිතය පෝෂණය වන බව ආදි කැණු ඇත්නම් ලකුණු ලබා දෙන්න.

III **ජේසුස් වහන්සේ සිදු කල ප්‍රාතිහාර්ය**

- ජේසුස් වහන්සේ නපුරාගේ බලය දුරු කරමින් දේව රාජ්‍යය උදා වූ බව සනාථ කිරීමට ප්‍රාතිහාර්ය සිදු කල බව.

ප්‍රාතිහාර්ය වර්ග 4 කි.

1. රෝගීන් සුව කිරීම සම්බන්ධ ප්‍රාතිහාර්ය උදා: අතක් පණ නැති මිනිසා
2. දුෂ්ටාත්ම දුරු කිරීම සම්බන්ධ ප්‍රාතිහාර්ය උදා: ගෙරසීන රටේ මිනිසා
3. ස්වභාව ධර්මය හා සම්බන්ධ ප්‍රාතිහාර්ය උදා : මුහුද මත ඇවිදීම
4. මළවුන් නැගිටුවීම සම්බන්ධ ප්‍රාතිහාර්ය උදා: ලාසරස් මළවුන්ගෙන් නැගිටු වීම.

- දෙවියන් වහන්සේ මිනිසාට දක්වූ අසීමිත ප්‍රේමය ප්‍රකාශ වීම.
- දෙවියන් වහන්සේ මනුෂයාට අනාවරණය වීම.
- දේව මහිමය හා බලය ප්‍රකාශ වීම.
- ජේසුස් වහන්සේ දේව පුත්‍රයා බව සහතිකවේ. ආදි කරුණු ලියා ඇත්නම් ලකුණු දෙන්න.

IV **සාමය පිළිබඳ කිතුණු ඉගැන්වීම**

- පැරණි ගිවිසුමේ සාමය සඳහා යෙදුණු හෙබ්‍රෙව් වචනය ෂාලෝම් (shalom)
- ෂාලොම් යනු ඇතුළාන්ත සාමයයි.
- ඇතුළාන්ත සාමයට මූලික වන්නේ සත්‍ය, යුක්තිය, ප්‍රේමය හා නිදහසයි.
- යුද්ධය, ප්‍රචණ්ඩ ක්‍රියා යනාදිය නොමැති විම.
- අන් අයගේ අවශ්‍යයතාවලට සංවේදී වීම.
- අන් අයට ගරු කිරීම හා සහෝදර දයාවෙන් කටයුතු කිරීම වැදගත්ය.
- "සාමය ඇති කරන්නෝ භාග්‍යවන්තයෝය" ජේසුස් වහන්සේගේ ඉගැන්වීම්.
- ජේසුස් වහන්සේ සාමයේ කුමරයාණන් බව
- සමඟි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය ස්ථාපිත කරමින් පාපයන්ට සමාව දී මිනිස් හදවත් තුළ ඇතුළාන්ත සාමය උදා කිරීමට ශුද්ධ වූ සභාවට පැවරීම
- සතුරාට ප්‍රේම කළ යුතු බව යනාදි කරුණු ඇත්නම් ලකුණු ලබා දෙන්න.